# අපේ සතුටු දවස



අදිති බිනුල්යා වික්‍රමසිංහ

# අපේ සතුටු දවස


## අදිති බිනුල්යා වික්‍රමසිංහ

කතෘ

3 ශ්‍රේණිය D

මහාමායා බාලිකා විද්‍යාලය

මහනුවර


2025.02. 08

කතෘගේ වෙනත් කෘති: ආඩම්බර කුරුලු පැංචි

# පිදුම

**මාගේ ආදරණීය විදුහල් මාතාවට**

**ගෞරවයෙන් පුදමි.**

## ස්තූතිය!

පොත් රචනය සඳහා අවස්ථාව සලසා දී අපව උනන්දු කරමින් එයට සඳහා අප යොමු කළ, අප විදුහල්පතිනිය ශෂිකලා සේනාධීර ගුරු මැණියන්ටත්, ප්‍රාථමික අංශ විදුහල්පතිනිය සුසිතා අල්විස් ගුරු මැණියන්ටත්, සමන්මලී ගුරු මැණියන්ටත්, අප පන්තිභාර නිලූෂිකා ගුරුසිංහ ගුරු මැණියන්ටත්, මාගේ සෑම කාර්යයේ දී ම මා හට නිරන්තරයෙන් ම සහය වන මාගේ මවටත් මාගේ ස්තුතිය පුදමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විෂස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත්කතුවරියන් සමත් වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කර්තෘ කරදන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන "හෙරණගත්කරණී" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛනකරණයට යොමු වීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශෂිකලා සේනාධීර

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

# අපේ සතුටු දවස

නංගී නංගී නැගිටින්නකෝ .... දැන් වෙලාව අටටත් ළඟයි.

අද සෙනසුරාදා. අපේ නිවාඩු දවසනේ. තව ටිකකින් තරුෂිලත් එයි.



හුරේ!!!!! අද අපේ සෙල්ලම් දවස. හුරේ!!!!

කෑ ගහන ගමන් නංගී ඇඳෙන් බිමට පැන්නා.

නංගී දුවගෙන ගියේ මූණ හෝදන්න.

එතකොට ම අම්මා කොස්සත් අරගෙන ආවා අපේ කාමරය අතුගාන්න. කලබලය වැඩි කමට නංගී දිව්වේ අම්මාගේ ඇගේ හැප්පීගනමයි.

"ඉස්කෝලේ යන දවසට මෙයාව නැගිට ගන්න තියෙන අමාරුව, ඒකට අද. " අම්මා කිව්වෙ හිනා වෙවී.

මමයි නංගියි ලෑස්ති වෙලා, අම්මා උදේට හදලා තිබුණ ඉදිආප්ප, පොල් සම්බෝලයි කිරි හොදි යි එක්ක බඩ පිරෙන්න කෑවා. ඊට පස්සේ අපි දෙන්නා මිදුලට වෙලා බලාගෙන හිටියේ තරුෂිලා එනකන් .

අද සෙනසුරාදා, නිවාඩු දවස. ඒ කියන්නේ අපේ සෙල්ලම් දවස. සතියේ දවස් පහේ ම අපි ඉස්කෝලෙ ගිහින් පාඩම් වැඩ කරනවා. ඉරිදා දවසෙත් දහම් පාසල් යන්න තියෙනවා .ඒ වගේ ම ඉස්කෝලෙ දෙන ගෙදර වැඩ කරන්නත් තියනවා.ඒක නිසා සෙනසුරාදා දවස අපි කැමති විදිහට නිදහසේ සතුටින් සෙල්ලම් කරන්න, අපේ අම්මයි තාත්තයි අපිට අවසර දීලයි තිබුනෙ.

තරුෂිලාටත් එයාලගෙ ගෙදරින් ඒ අවසරය ලැබිලා තිබුණා .

තරුෂි , මලිති මගේ හොඳම යාලුවෝ. එයාලා ඉන්නේ අපේ ගෙදරට ගොඩක් කිට්ටුව. අපේ මිදුලේ සෙල්ලම් කරන්න ගොඩක් ඉඩ තිබුණ නිසා එයාලා ගොඩක් වෙලාවට අපේ ගෙදරට ආවා සෙල්ලම් කරන්න .

“අක්කේ අන්න තරුෂි අක්කලා එනවා” නංගි කෑ ගැහුවා.

“ආ කොහොමද අදිති ?” තරුෂි ඇහුවා.

“හොඳයි හොඳයි” අදිති කිවුවා.

“හරි හරි අපි අද මොකක්ද කරන සෙල්ලම ?” මලිති ඇහුවා.

“අද අපි සෙල්ලම් ගෙයක් දාමු.” මම කිවුවා

“ආ ඒක හොඳයි, මම කැමති.” මලිති කිව්වා.

“අපිත් කැමති.” හැමෝම කැමති වුණා.

“දැන් අපි කොහොමද අපේ සෙල්ලම් ගෙදර හදන්නෙ?” නංගී ඇහුවා.



“ ඉන්න කෝ මම අත්තම්මාගෙන් පරණ සාරියක් ඉල්ලගෙන එන්නම්. ඔයාලා තැනක් හොයන්නකො අපේ සෙල්ලම් ගෙදර හදන්න.” එහෙම කියලා මම ගියේ අත්තම්මා හොයා ගෙන.

“අත්තම්මෙ, අත්තම්මෙ...!”

“ඇයි මගෙ දුවේ?”

“අත්තම්මේ, අපිට සෙල්ලම් ගෙයක් හදන්න අත්තම්මා ළඟ පරණ සාරියක් තියෙනවානම් දෙන්න පුළුවන්ද? මම ඇහුවා.

“ම් ම් පොඩ්ඩක් ඉන්නකෝ දෝණී, මම බලන්නම්කෝ.”

“ආ..... මේ තියෙන්නෙ හොඳ සාරියක්, මේකෙන් මගෙ දූවලට සෙල්ලම් ගේ හදන්න පුළුවන් වෙයි. ආ.. මේක අරගන්න.”

“ස්තූතියි අත්තම්මේ...”

“යාළුවනේ, මේ බලන්න. අත්තම්මා මට පරණ සාරියක් දුන්නා අපේ සෙල්ලම් ගේ හදන්න.” මම දුවගෙන ගිහින් හැමෝටම සාරිය පෙන්නුවා.

“අපිත් අර පේර ගහ යට අතු ගාලා සුද්ද කළා, අපේ සෙල්ලම් ගෙදර හදන්න එතන හොදයි. නැන්දා අපිට ලී දඬු ටිකක් කපලා දුන්නා” තරුෂි කිව්වා

“හුරේ !!!! දැන් අපිට සෙල්ලම් ගෙදර හදන්න පුළුවන්.”

අපි හැමෝම හරි සතුටෙන් අපේ සෙල්ලම් ගෙදර හදන්න පටන් ගත්තා. පේර ගහ යට ලී දඬු හිටවලා, ඒ හිටවපු ලී දඬු යා කරලා වහලයත් ලී දඬු වලින් ගැට ගැහුවා.



ඊට පස්සෙ අත්අම්මගෙ සාරිය අරගෙන ලී දඬු වට කරලා ගැට ගහලා, ලොකු කාඩ් බෝඩ් පෙට්ටියක් ගෙනත් වහලට දැම්මා. ඊට පස්සෙ අපේ මිදුලෙ තිබුණ ෆාම්ස් ගහකින් අතු ටිකක් කඩාගෙන කාඩ් බෝඩ් එක උඩට දාලා වහලය හදා ගත්තා. පැදුරක් ගෙනත් බිමට එළලා, අපි සෙල්ලම් කරන්න ගන්න සෙල්ලම් බඩු ටිකකුත් ගෙනත් තියලා අපි ලස්සනම ලස්සන සෙල්ලම් ගෙයක් හැදුවා. අපේ අම්මත් අපිට ගොඩක් උදව් කළා.

අපි හැමෝටම හරිම සතුටුයි.

"අපිට ලස්සන සෙල්ලම් ගෙයක් තියනවා.... හුරේ..." හැමෝම සතුටෙන් කෑ ගැහුවා.



“අපි  දැන් මොනවද කරන්නනේ…?” මලිති ඇහුවා.

“අපි අද සෙල්ලම් බත් උයමු.” තරුෂි කිව්වා.

හැමෝම කැමති  වුණා. අපේ ගෙදර තිබුණ පරණ මුට්ටි, කිරි හට්ටි, පොල් කටු, ගස් වලින් කඩා ගත්ත කොළ, මල් ගෙඩි ජාති, පොල් කුඩු අරගන සෙල්ලම් බත් ඉවුවා. ඊට පස්සෙ බෝල පාස් කරා. බට්ටා පැන්නා. ගොඩාක් සෙල්ලම් කළා.

“ආ.... මෙන්න දරුවො, මේ තේ ටික බීලා ඉන්න”



අපේ අම්මා අපිට කැවිලි එක්ක තේ අරගන ආවා. අපි සෙල්ලම් කරන වෙලාවට හැමදාම අපේ අම්මා අපිට කෑම හදලා ගෙනත් දෙනවා. සමහර දාට තරුෂිලාගෙ අම්මත් අපිට කැවිලි එවනවා, සෙල්ලම් කරන කොට කන්න.

අපි අපේ සෙල්ලම් ගෙදර ඇතුළෙ ඉඳගනම කැවිලිත් එක්ක තේ බිව්වෙ ගොඩක් ආසාවෙන්.තේ බීලා ඉවර වෙලා අපි තව සෙල්ලම් කළා.

“අම්මෝ .. දැන් නම් හරි මහන්සියි”

“ එහෙනම් අපි වලාකුළු රටා බලමු ද?” මම ඇහුවා.

“ හා ඒක හොඳයි. අපි ඉස්කෝලෙදිත් ඒක කළා.” මලිති කිව්වා.



“අර බලන්න අර වලාකුළ හරියට තාරාවෙක් වගේ.”

“ඔව්මයි. මෙතනත් තියනවා ලොකු වලාකුළු නැවක්”

“ මේ බලන්න, ඩොල්ෆින් හැඩය තියෙන වලාකුළක්. හරි ලස්සනයි නේද?”

සුළඟට පාවී පාවී වලාකුළු අහසේ හදන රටා, එක එක රූප අපි හරි ආසාවෙන් බලාගෙන හිටියා.

“ දැන් නම් හවස් වෙන්නත් ළඟයි. අම්මත් බලාගෙන ඇති අපි එනකන්. අපි දැන් ගෙදර යන්නම්. හෙට දහම් පාසල් යන්නත් තියෙනවනෙ.” තරුෂි කිව්වා.

“ඔව්, දහම් පාසලේ දුන්න ගෙදර වැඩත් තියෙනවා කරන්න.” මම කිව්වා.

“අපේ සෙල්ලම් ගෙදර මේ විදිහට ම තියමු. එතකොට අනිත් දවසෙත් අපිට සෙල්ලම් කරන්න පුළුවන්.” නංගී කිව්වා.

“එහෙනම් අපි යන්නම්. නැන්දේ.... අපි ගිහින් එන්නම්.”

“හොඳයි පුතේ. දෙන්නම පරිස්සමට ගිහින් එන්න.”

යාළුවෝ ගියාට පස්සෙ මමයි නංගියි තව ටික වෙලාවක් අපේ සෙල්ලම් ගෙදරට ගිහිල්ලා සෙල්ලම් කළා. ඊට පස්සෙ ඇඟ සෝදගෙන කෑම කාලා අපේ පාඩම් වැඩ කරන්න පටන් ගත්තා.

එදා අපේ නිවාඩු දවස, අපි හැමෝම ගොඩාක් හොඳින් සතුටින් ගත කළා. ඒක තමයි අපේ සතුටු දවස.

නිමි.

පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔක් නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වනවිට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මේවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබා දිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස් වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගලපමින් දැනට වසර දෙකක සිට රටේ පාසල් දරුවන් සමඟ එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයින් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසඟ සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මාගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක

සෙනවිරත්න මහලේකම්





ISBN 978-624-208-696-5